# සුභාෂිතයෙන්

*විහිදු තුරු සෙනඟ පිරිවර යුතු* *නොමින*
*සිනිදු අමා කිරනින් ලොව* *බබලුවන*
*තරිඳු දිනිඳු හමු වත නොදිලෙන* *ලෙසින*
*කෙබඳු කෙනෙක් ලුහු නොම වෙති අන්* *සදන*

**ගැදි කවිය :**
නොමින විහිදු
තුරු සෙනඟ පිරිවර යුතු
සිනිඳු අමා කිරනින්
ලොව බබුලුවන
තරිඳු
දිනිඳු හමු වන
නොදිලෙන ලෙසින
අන් සදන
කෙබඳු කෙනෙක්
ලුහු නොම වෙති.



**තේරුම :** බොහෝ සේ පැතිර පවතින තාරකා නමැති පිරිවර ඇති, සිනිඳු වූත් අමෘතමය වූත් රැස් කඳින් ලෝකය බබලන්නා වූ චන්ද්‍රය (පවා) සූර්යයා හමුවේ නොදිලෙන්නාක් මෙන්, කවර නම් කෙනෙක් අනුන්ගේ නිවසේ දී හැල්ලු නොවෙද්ද ?



වි ක ධර්මබන්ධු

**පැහැදුම :** ඕනැම කෙනකුගේ ලොකුව පිට ගෙදරක දී නැති වේ. එය හරියට හිරු හමුවේ සඳු ගේ (දිලුම) දිලිසීම නැතිවීම වැනිය.

රජුන් හාමුදුරුවන් ගැන සිතන විට මේ කියමන වෙනස් වෙතැයි සිතමි. යමකු ඇරැහීම ;සෘසෘ්ඹ* සඳහා පැමිනෙන පොලිස් නිලදරුවන්ට වුවත් මෙය අදාල නැත.

තුරු සෙනඟ - තාරකා නැමැති පිරිවර සෙනඟ, අමා කිරන - අමාවෙහි රස ගුන බැලු කෙනකු නැතත් එය ඉතා මදුර වූත්, ඉතා සුවකුරු වූත් එකක් බව කියති. සුරඟනන්ගේ රූ සපුව මෙනි. තරිඳු - තරු + ඉඳු - ඉඳු යනු ප්‍රදාන / නායක යන තේරුම දෙන පදයකි. දිනිඳු - දින + ඉඳු, සුරිඳු - සුර + ඉඳු, නිරිඳු - නර + ඉඳු මෙනි. තරිඳු යනු නායක තාරකාවයි. සඳත් තරුවක් ලෙස සලකා ඇත. ලුහු: කෙටි, කුඩා, අඩු යන තේරුම ඇත. පැදි ලියමනේ දී ලුහු-ගුරු යනු කෙටි - දිගු යන තේරුම ගැනේ.

4 වන පිටෙන්

ගණනින් තම දකුණේ දරුවන් මරා දැමූවේ ද මේ හමුදාව ම බවයි.

“අනේ පුතේ අපි උඹලාට බෝධි පූජා තිබ්බා.. ඇයි අපිට වතුර ඉල්ලූවම ගහන්නේ...” යයි අපට අසන්නට සිදුවන්නේද ඒ නිසාම ය. රණවිරුවන්ට ලේ දන් දුන් අත් දැන් ඉතින් කපා දමන බව කියන්නට තරුණයන්ට සිදු වී ඇත්තේ ද ඒ නිසාය.

ජනතාව විසින් ම ඡන්දය දී පත්කළ පාලකයින් සුපිරි වාහනවල පාරේ යන විට තමන් ට බෝධි පූජා තැබූ ජනතාව කාණුවට බස්සවා ඉඩ අරන් දෙන්නේ කවුද? (ඒ ඔබ පෙම් කළ) හමුදාව ය. ගාල්ල බස් නැවතුම්පොළේ හයිවේ බස් රථයෙන් කොළඹ ඒම සඳහා හරි පෝලිමෙන් පිට් හමුදා පෝලිම් යනුවෙන් එකට දෙකක් හදාගෙන පෝලිමේ උන් ජනතාව බලා සිටියදී බලය පාවිච්චි කර යන්නේ ද ඒ හමුදාව ම ය. තමන් ජනප්‍රිය කොට දේවත්වයට නැංවූ මාධ්‍යකරුවන්ට් තොපි තමයි මේ හැමදේම කරන්නේයි කියමින් රතුපස්වලදී පහර දෙන්නේ ද (ඒ මාධ්‍යකරුවන් පෙම් කළ) හමුදාවම ය.

මාධ්‍ය විසින් සහ රජය විසින් සූත්‍රගත කරන ලද සමීකරණයකට අනුව් අපි වෙනුවෙනි සටන් කළ හමුදාව එක්වරම් අපට් එරෙහි වන්නේ මන්දැයි යන පැනය බේරා ගැනීමට සාමාන්‍ය ජනතාවට අපහසු ය. සත්‍යය නම් රජයේ හමුදාවක් කිසිවිටෙක ජනතාව වෙනුවෙන් සටන් නොකරන අතර ඔවුන් අණ පිළිපදිනවා පමණි. එතැනදී එය හුදු අවි දැරූ යාන්ත්‍රණයක් මිස ” අපේ යමක් නොවේ.” අපේ අය හෝ ඔවුන් යන්න වෙනුවට එයි යනුවෙන් ආදේශ කොට හමුදාව දෙස බැලුවහොත් මෙය ජනතාවට පැහැදිළි වනු ඇත. මනසක් නැති යාන්ත්‍රණයක් වන එයට මානුෂීය මෙහෙයුමක අයිසිං තැවරූ මාධ්‍ය හා පැහැදිළි ලෙස ම උපක්‍රම භාවිත කරමින් සූක්ෂමව දේපළ සහ බලය භුක්ති විඳින රෙජීමය ද එකසේ ජවය සපයයි. ඒ සිය පැවැත්ම තකා ය. යථාර්ථය තුළ ජනතාව යනු මේ සියල්ලෙන් පරිබාහිර යමක් වන අතර බලෙන් යාන්ත්‍රණයට අයත් වෙන්නට උත්සාහ කිරීම තුළ හෝ් අපි වෙනුවෙන් අපි වීම තුළ හෝ ඔවුන් සොයන ආරක්ෂාව සහ අධිපති මානසිකත්වය යනු හුදු ෆැන්ටසිමය මනෝභාවයක් පමණි.

**ඊළඟ සති කිහිපය තුළ දී ආරක්ෂක ලේකම්තුමා හෝ ජනාධිපති තුමා මැදිහත්ව මැරුණු අයගේ පවුල්වලට වන්දි ගෙවා කර්මාන්ත ශාලාවට අවවාද කොට,් යුධ හමුදා සිද්ධිය පිළිබඳ පරීක්ෂණ වැනි ප්‍රවෘත්තියක් දිනමිණ පත්තරේ වාටියක පළ කර මේ සිද්ධිය අමතක කොට දැමීමට නියමිත ය.**

## ලංකාව කියවීම

1956, 1971, 1989 හෝ 2009 මඟ හැර අපට ලංකාව කියවිය නොහැක. එ මෙන්ම මීගමුවේ ඇන්ටනී, කටුනායක රොෂේන් චානක, තුම්මුල්ලේ සාමකාමී විරෝධතාව බොබසෙ සහ ආරක්ෂක අංශ විසින් පලවා හැරීනු ලැබීම, මාධ්‍යවේදීන් රටින් පලවා හැරීම, අතුරුදන් කිරීම සහ මරා දැමීම, කලාකරුවන් ද විපක්ෂ දේශපාලකයින් ද රෙජීමයේ අසීමිත බව තුළ හැකිලී අවනත වීම ඇතුලූ ඉහත කී සියලූ කාරණා සංයුක්තව කියවා ගැනීමකින් තොරව සිද්ධියෙන් සිද්ධිය වියුක්තව කියවා ප්‍රතිචාර දැක්වීම තුළ ද කිසිවක් සිදු නොවනු ඇත.

ලංකාවේ පොදු ජනතා මනසට කවදාවත් කරගත නොහැකි වූ දෙය නම් සැබෑ සතුරා හඳුනාගැනීම යි. තමන් සිටින්නේ ද අනෙක් සුළු ජන හා ආගමික කොටස් සමඟ ම පීඩිත අවවරාප්‍රසාදිත කුලකයේ ම බව වටහා ගන්නා තෙක් ඔවුන් මේ ව්‍යාධිමය මහ ජාතික සිහිනයේ පල් වෙමින් සිටීමට නියමිත ය. හමුදාව බඳු අසංවේදී යාන්ත්‍රික ව්‍යුහයන්ගෙන් ආත්මීය හා මානුෂික ප්‍රශ්න අසමින් යැදීමට නියමිත ය. ඔවුන් සැබෑව වටහා ගත් දිනෙක මේ සියලූ යාන්ත්‍රණයන් බල රහිත වන බව පාලකයින් ද හොඳින් දනියි. මේ සියලූ රංගනයන් ඒ වැටහීම වඩා දුරස් කොට තබනු පිණිස ම ය.


MERCURY
TAXATION & ACCOUNTING PROFESSIONALS
REGISTERED TAX AGENT
All types of Tax Returns
BAS & IAS
Bookkeeping & Accounting
Business & Taxation
Advisory Services
Business Formation
SPECIAL RATES FOR STUDENTS
HOME VISITS
CALL US FOR FRIENDLY PROFESSIONAL SERVICE
WANTIRNA SOUTH
Priyanka Withana
CPA, ACMA(UK), CA(SL), B Sc (Bus Admin) (Hons)
0430171750
E | mercury.priyanka@gmail.com
BUNDOORA
Dilan Weerasooriya
Mast Acc(AUST), ASA, B Sc (Bus Admin) (Hons)
0423399212
E | mercury.dilan@gmail.com
Office 25 Mockridge St Wantirna South VIC 3152



Do you need
Your Own Sri Lankan Accountant With
- Personalized Advice at Any Time
- Pre Agreed Fixed Fee & No More Surprises
- Always Close to Your Business Physically and in Mind

“We will take care of you”

Over 10 Years Experienced Service For
- Individual and Business Tax Returns
- GST & BAS
- Bookkeeping Services (MYOB and QuickBook)
- Business Start Up Solutions (Incorporations & System Design)
- Software Training
- Small Business Advice and Training



Amali Liyanage
"Advance Tax & Business Consultant"
M.Com.B.Sc.ASA
Registered Tax Agent
M : 0433 732 854
T : 03 8749 2148
e : advanceab@iinet.com.au
43 Golf Links Drive
Beveridge - 3753
next to Craigieburn
www.advanceab.com